ශ්‍රී ලංකාවේ ඉතිහාසය

1. මහාසේන රාජ්‍ය සමයේ අවසානය තෙක් ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමෙහි ලා මූලාශ්‍රයක් ලෙස මහාවංසයේ ඇති වැදගත්කම පහත සඳහන් මාතෘකා යටතේ සඳහන් කරන්න.
   1.) කර්තෘත්වය හා රචිත කාලය
   2.) අඛණ්ඩ හා කාලනීර්ණායානුකූල ඉතිහාසයක් ඉදිරිපත් කිරීම.
   3.) අභිලේඛන මූලාශ්‍රයවලින් තොරතුරු තහවුරු වීම.

2. ශ්‍රී ලංකා ඉතිහාසයෙහි වළගම්බා රජතුමාගේ දේශපාලන හා සංස්කෘතික කාර්යසිද්ධිය විවේචනාත්මකව විමසන්න.

3. වාරිකර්මාන්තය රජරට ශිෂ්ටාචාරයේ ප්‍රධාන අංගයකි.

   1.) පණ්ඩුකාභය රජතුමා විසින් කරවන ලද වැවක් නම් කරන්න.
   2.) මින්නේරිය හා ගිරිතලේ යන වැව් ඉදි කරවන ලද රජවරුන් නම් කරන්න.
   3.) වැවක ප්‍රධාන අංග හා ඒවායින් ඉටු වූ කාර්යය සැකෙවින් දක්වන්න.
   4.) වාරි කර්මාන්තය රජරට ශිෂ්ටාචාරයේ ප්‍රධාන අංගයක් වන අයුරු පැහැදිලි කරන්න.